
# 08. වෙළෙඳ බලපත්‍ර නිකුත් කිරීම - ගැලීම් සටහන



පෙර පිටුවෙන්

නිර්දේශය නාගරික කොමසාරිස් / ලේකම් වෙත යොමු කිරීම

වගකීම: විෂය භාර නිලධාරි

↓

නිර්දේශය අනුමත කිරීම

වගකීම: නාගරික කොමසාරිස් / සභාපති

↓

බලපත්‍රය අත්සනට ඉදිරිපත් කිරීම

වගකීම: විෂය භාර නිලධාරි

↓

බලපත්‍රය අත්සන් කර විෂය භාර නිලධාරිට යොමු කිරීම

වගකීම: නාගරික කොමසාරිස් / සභාපති

↓

අත්සන් කළ බලපත්‍රය පෙරටු කාර්යාලයට යොමු කර ගාස්තුව ගෙවා බලපත්‍රය ලබා ගන්නා ලෙස ඉල්ලුම්කරු දැනුම්වත් කිරීම

වගකීම: විෂය භාර නිලධාරි

↓

ගාස්තුව ගෙවා බලපත්‍රය ලබා ගැනීම (ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පහසුකම් ඇති විට ඒ මගින් හෝ නැති විට පෙරටු කාර්යාලයට පැමිණ)

වගකීම: ඉල්ලුම්කරු

↓

බලපත්‍ර ගාස්තුව අය කර ගෙන ලදුපත හා බලපත්‍රය ඉල්ලුම්කරුට භාර දීම

වගකීම: පෙරටු කාර්යාල නිලධාරි

↓

ආදායම ගිණුම් ගත කිරීම හා බලපත්‍ර ගාස්තු ලේඛනය යාවත්කාලීන කිරීම

වගකීම: පෙරටු කාර්යාල නිලධාරි

අඩුපාඩු නිවැරදි කිරීමට සිහි කැඳවීම

වගකීම: විෂය භාර නිලධාරි

↓

නියමිත දින වන විට අඩුපාඩු සම්පූර්ණ කර නොමැති නම් අධිකරණ ක්‍රියා මාර්ග ගැනීමට ආදායම් පරීක්ෂකට දැන්වීම

වගකීම: විෂය භාර නිලධාරි

කාර්යසාධක දර්ශකය



# 08. වෙළෙඳ බලපත්‍ර නිකුත් කිරීම

## 1. හැඳින්වීම

බල ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය, සනීපාරක්ෂාව, පහසුව, සුබ විහරණය සහ සියලු පහසුකම් ආරක්ෂා කිරීමට අදාළ කරුණු විධිමත් කිරීම, පාලනය කිරීම හා පරිපාලනය කිරීම පළාත් පාලන ආයතනවලට පැවරී ඇති ප්‍රධාන කර්තව්‍යය වේ. බල ප්‍රදේශය තුළ පවත්වා ගෙන යනු ලබන වෙළෙඳාම් හෝ ව්‍යාපාර අතරින් මහජන සෞඛ්‍යයට, සනීපාරක්ෂාවට, පහසුවට හා සුබ විහරණයට යම් ආකාරයක අහිතකර බලපෑමක් ඇති විය හැකි වෙළෙඳාම් හෝ ව්‍යාපාර විධිමත් කිරීම හා පාලනය කිරීමට අදාළ ව, 252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥාපනත යටතේ / 255 වන අධිකාරය වූ නගර සභා ආඥාපනත යටතේ / 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ, එකී යම් සභාවක් විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන යටතේ ඒ වෙළෙඳාම හෝ ව්‍යාපාරය පවත්වා ගෙන යනු ලබන ස්ථානය සඳහා එකී සභාවේ නාගරික කොමසාරිස්වරයා / සභාපතිවරයා විසින් නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් ලබා ගත යුතු ය. මේ කාර්යය නියාමනය කිරීම එකී සභාවේ වගකීම වේ.

සටහන: සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථා ද, සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථා වශයෙන් සැලකිය යුතු ය.

## 2. නීතිමය අධිකාරය

(අ) මහා නගර සභා ආඥාපනතේ 267 වන වගන්තිය / නගර සභා ආඥාපනතේ 153 වන වගන්තිය / 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තිය යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථා හෝ ඒ යටතේ සාදන ලදැයි සලකනු ලබන හා සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථා;

(ආ) මහා නගර සභා ආඥාපනතේ 148අ / නගර සභා ආඥාපනතේ 128අ / ප්‍රාදේශීය සභා පනතේ 167 වන වගන්ති;

(ඇ) මහා නගර සභා ආඥාපනතේ 247අ / නගර සභා ආඥාපනතේ 164 / ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්ති;

(ඈ) වෙළෙඳ බලපත්‍රය අදාළ වන කර්මාන්තය, පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගත යුතු කර්මාන්තයක් වන විට 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23ව වගන්තිය.

## 3. සුදුසුකම්

(අ) යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ, සභාවෙන් බලපත්‍රයක් ලබා ගත යුතු වෙළෙඳාමක් හෝ ව්‍යාපාරයක් විය යුතු ය.

(ආ) ජාතික පාරිසරික පනත යටතේ සාදන ලද නියෝග අනුව පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගත යුතු කාර්යයක් වන අවස්ථාවක, වලංගු පරිසර ආරක්ෂණ බලපත්‍රයක් තිබිය යුතු ය. (1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23ව වගන්තිය)

## 4. ගාස්තුව

(අ) කර්මාන්තය පවත්වා ගෙන යන ස්ථානයේ වාර්ෂික වටිනාකම මත මෙම ගාස්තු ප්‍රමාණය විචලනය වේ.

(ආ) ඒ කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම -

(iii) ඒ ස්ථානය මහා නගර සභාවක බල ප්‍රදේශයක් ඇතුළත පිහිටා ඇති විට,

| ස්ථානයේ වාර්ෂික වටිනාකම | බද්දේ ප්‍රමාණය |
|---|---|
| රු. 1,500.00 නො ඉක්මවන විට බද්ද, | රු. 2,000.00 |
| රු. 1,500.00 ඉක්මවන හා රු. 2,500.00 නො ඉක්මවන විට බද්ද, | රු. 3,000.00 |

රු. 2,500.00 ඉක්මවන විට බද්ද, රු. 5,000.00

(iii) ඒ ස්ථානය නගර සභාවක හෝ ප්‍රාදේශීය සභාවක බල ප්‍රදේශයක් ඇතුළත පිහිටා ඇති විට,

| **ස්ථානයේ වාර්ෂික වටිනාකම** | **බද්දේ ප්‍රමාණය** |
|---|---|
| රු. 750.00 නො ඉක්මවන විට බද්ද, | රු. 500.00 |
| රු. 750.00 ඉක්මවන හා රු. 1,500.00 නො ඉක්මවන විට බද්ද, | රු. 750.00 |
| රු. 1,500.00 ඉක්මවන විට බද්ද, | රු. 1,000.00 |

**5. ඉදිරිපත් කළ යුතු ලේඛන.**

(අ) මෙහි ඇමුණුම් අංක 01 හි ආකෘතියට අනුව වන ඉල්ලුම් පත්‍රය;

(ආ) ජාතික පාරිසරික පනත යටතේ සාදන ලද නියෝග අනුව පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගත යුතු කාර්යයක් වන අවස්ථාවක, වලංගු පරිසර ආරක්ෂණ බලපත්‍රය.

**6. කාර්ය පටිපාටිය.**

| පටිපාටිය | කාල සීමාව | අධිකාරය |
|---|---|---|
| ආදායම් ප්‍රභව සමීක්ෂණයට සමගාමීව වෙළෙඳ බලපත්‍ර ඉල්ලුම් පත් බෙදා දීම | සෑම වර්ෂයක ම නොවැම්බර් මස 15 වන දිනට පෙර | ආදායම් පරීක්ෂක |
| සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍ර රැස් කර ගැනීම | සෑම වර්ෂයක ම නොවැම්බර් මස 20 දිනට පෙර | ආදායම් පරීක්ෂක |
| ඉල්ලුම් පත්‍රයේ තොරතුරු, පසුගිය වර්ෂයේ ආදායම් ප්‍රභව සමීක්ෂණ තොරතුරු සමග සැසඳීම | සෑම වර්ෂයක ම නොවැම්බර් මස 20 වන දිනට පෙර | ආදායම් පරීක්ෂක |
| සභාවේ තාක්ෂණ නිලධාරීගේ නිර්දේශය ප්‍රමාණවත් ඉල්ලුම් පත්‍ර සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීගේ නිර්දේශ අවශ්‍ය කරන ඉල්ලුම් පත්‍ර වෙන් කර විෂය භාර නිලධාරි වෙත භාර දීම | සෑම වර්ෂයක ම නොවැම්බර් මස 30 වන දිනට පෙර | ආදායම් පරීක්ෂක |
| සභාවේ තාක්ෂණ නිලධාරීගේ නිර්දේශය ප්‍රමාණවත් ඉල්ලුම් පත්‍ර තාක්ෂණ නිලධාරිට ද සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීගේ නිර්දේශ අවශ්‍ය කරන ඉල්ලුම් පත්‍ර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිට ද නාගරික කොමසාරිස් / ලේකම් මගින් භාර දීම | ආදායම් පරීක්ෂක විසින් ඉල්ලුම් පත්‍ර භාර දුන් දිනයේ ම | විෂය භාර නිලධාරි |
| ඉල්ලුම් පත්‍රයට අදාළ පරිශ්‍රයට ගොස් ස්ථානීය පරීක්ෂාව කර නිරීක්ෂණ හා නිර්දේශ සහිත ඉල්ලුම් පත්‍ර විෂය භාර නිලධාරිට භාර දීම | සෑම වර්ෂයක ම දෙසැම්බර් 15 දිනට පෙර | මහජන සෞඛ්‍ය පරීක්ෂක / තාක්ෂණ නිලධාරි |
| නිර්දේශිත ඉල්ලුම් පත්‍ර නාගරික කොමසාරිස් / සභාපති වෙත යොමු කිරීම | සෑම වර්ෂයක ම දෙසැම්බර් 15 දිනට පෙර | විෂය භාර නිලධාරි |
| නිර්දේශය අනුමත කිරීම | සෑම වර්ෂයක ම දෙසැම්බර් 15 දිනට පෙර | නාගරික කොමසාරිස් / සභාපති |

| පටිපාටිය | කාල සීමාව | අධිකාරය |
| --- | --- | --- |
| බලපත්‍රය (ඇමුණුම 02) සකස් කර අත්සනට ඉදිරිපත් කිරීම | සෑම වර්ෂයක ම දෙසැම්බර් 15 දිනට පෙර | විෂය භාර නිලධාරි |
| බලපත්‍රය අත්සන් කර විෂය භාර නිලධාරි වෙත යොමු කිරීම | සෑම වර්ෂයක ම දෙසැම්බර් 15 දිනට පෙර | නාගරික කොමසාරිස් / සභාපති |
| අත්සන් කළ බලපත්‍රය පෙරටු කාර්යාලයට යොමු කර බලපත්‍ර ගාස්තු ගෙවා බලපත්‍රය ලබා ගන්නා ලෙස ඉල්ලුම්කරුට දැන්වීම | සෑම වර්ෂයක ම දෙසැම්බර් 15 දිනට පෙර | විෂය භාර නිලධාරි |
| ගාස්තුව ගෙවා බලපත්‍රය ලබා ගැනීම (ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පහසුකම් ඇති විට, ඒ මගින් හෝ නැති විට පෙරටු කාර්යාලයට පැමිණ) | සෑම වර්ෂයක ම ජනවාරි මස 01 දිනට පෙර | ඉල්ලුම්කරු |
| ගාස්තුව අය කර ගෙන ලදුපත හා බලපත්‍රය (ඇමුණුම 02) ඉල්ලුම්කරුට භාර දීම | සෑම වර්ෂයක ම ජනවාරි මස 01 දිනට පෙර | පෙරටු කාර්යාල නිලධාරි |
| ආදායම ගිණුම් ගත කිරීම හා බලපත්‍ර ගාස්තු ලේඛනය යාවත්කාලීන කිරීම | බලපත්‍රය නිකුත් කළ වහාම | පෙරටු කාර්යාල නිලධාරි |

සටහන: ඉහත පරිදි නිකුත් කරනු ලබන බලපත්‍රය අදාළ ක්‍රියාකාරකම, පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගත යුතු යම් ක්‍රියාකාරකමක් ද වන විට, ඊට අදාළ ව පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගන්නා තෙක්, පළාත් පාලන ආයතනය විසින් ඒ කාර්යය කරනු ලබන ස්ථානය සඳහා වෙළෙඳ බලපත්‍රය නිකුත් කිරීම නො කළ යුතු ය. [1988 අංක 57 දරන ජාතික පාරිසරික (සංශෝධන) පනත මගින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23ච වගන්තිය]

**7. බලපත්‍රය නිකුත් කිරීමට මහජන සෞඛ්‍ය පරීක්ෂක / තාක්ෂණ නිලධාරි නිර්දේශ නො කළ අවස්ථාව -**

| පටිපාටිය | කාල සීමාව | අධිකාරය |
| --- | --- | --- |
| බලපත්‍රය නිකුත් කිරීමට නොහැකි හේතු දක්වමින් නිර්දේශ කළ නොහැකි බව සඳහන් කරමින් ඉල්ලුම් පත්‍රය විෂය භාර නිලධාරි වෙත යොමු කිරීම | සෑම වර්ෂයක ම දෙසැම්බර් 15 දිනට පෙර | මහජන සෞඛ්‍ය පරීක්ෂක / තාක්ෂණ නිලධාරි |
| අඩුපාඩු නිවැරදි කරන ලෙස ඉල්ලුම්කරු දැනුම්වත් කිරීම | සෑම වර්ෂයක ම දෙසැම්බර් 15 දිනට පෙර | විෂය භාර නිලධාරි |
| අඩුපාඩු නිවැරදි කළ බව වාර්තා කිරීම | සෑම වර්ෂයක ම දෙසැම්බර් 15 දිනට පෙර | ඉල්ලුම්කරු |

ඇමුණුම් අංක 01

සභාවේ ලාංඡනය

# . . . . . . . . . . . .සභාව

## වෙළෙඳ බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වන ඉල්ලුම් පත්‍රය. . . 20 - වර්ෂය

1. කර්මාන්තය / වෙළෙඳාම හිමිකරු ගේ නම: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
2. පෞද්ගලික ලිපිනය: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
   . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
3. 

| ජාතික හැඳුනුම් පත්‍ර අංකය : | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|

4. දුරකථන අංක: ජංගම: . . . . . . . . . . . . . . . . . . . . . . නිවස: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
5. කර්මාන්තයේ / වෙළෙඳ ව්‍යාපාරයේ නම: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
6. කර්මාන්තයේ / වෙළෙඳාමේ ස්වභාවය: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
7. කර්මාන්තය / වෙළෙඳාම කරන ස්ථානයේ -
   (අ) ලිපිනය: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
   . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
   (ආ) වීථියේ / පාරේ නම: . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
   (ඇ) වරිපනම් අංකය: . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
   (ඉ) දුරකථන අංකය: . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
8. කර්මාන්තය / වෙළෙඳාම කර ගෙන යන ස්ථානය අයත් ග්‍රාම නිලධාරි -
   කොට්ඨාශයේ අංකය: . . . . . . . . . . . . . . . .කොට්ඨාශයේ නම: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
9. ව්‍යාපාර නාම ලියා පදිංචිය ලබාගෙන ඇත්නම් එහි යොමු අංකය: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
10. කර්මාන්තය/වෙළෙඳාම කර ගෙන යන ස්ථානයේ කළමනාකරු ගේ / නියෝජිතයා ගේ නම:
    . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
11. ජාතික හැඳුනුම් පත්‍ර අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|

12. දුරකථන අංක: ජංගම: . . . . . . . . . . . . . . . . . . . . . . නිවස: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

නාගරික කොමාසරිස් / සභාපති,

. . . . . . . . . . . . . . . . . . .සභාව.

ඉහත තොරතුරු සඳහන් කර්මාන්තය / වෙළෙඳාම පවත්වා ගෙන යන ස්ථානය සඳහා 20 . . . . . වර්ෂය වෙනුවෙන් කර්මාන්ත (වෙළෙඳ) බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි. මේ පිළිබඳ ව සාදන ලද අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන සමග මම එකඟ වෙමි.

. . . . . . . . . . . . . . . . . . . . . . . . .

දිනය: 20 . . . . . . . . . . . . . . . . . .    ඉල්ලුම්කරුගේ අත්සන

**කාර්යාල ප්‍රයෝජනය සඳහා**

මහජන සෞඛ්‍ය පරීක්ෂක / තාක්ෂණ නිලධාරි,

පසු පිටේ සඳහන් ඉල්ලුම් පත්‍රයට අදාළ ව වෙළෙඳ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වන ඔබගේ නිරීක්ෂණ හා නිර්දේශ කඩිනමින් මා වෙත ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලමි.

. . . . . . . . . . . . . . . . . . . . . . . . .

දිනය: 20 . . . . . . . . . . . . . . . . . .    නාගරික කොමාසාරිස් / ලේකම්

---

නාගරික කොමසාරිස් / ලේකම්,

1. කර්මාන්තය / වෙළෙඳාමට අදාළ අතුරු ව්‍යවස්ථාව: කොටස: . . . . . . . .නාමය: . . . . . . . . . . . . . . . . . . . . . . .
2. පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගත යුතු ක්‍රියාකාරකමක් වේ. / නොවේ. *
3. කර්මාන්තය / වෙළෙඳාම පවත්වා ගෙන යන ස්ථානය අතුරු ව්‍යවස්ථාවේ නියමවලට අනුකූල වේ. / පහත සඳහන් කරුණු නිවැරදි කළ යුතු ව ඇත.*
   (අ) . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
   (ආ) . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
   (ඇ) . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
   (ඉ) . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
4. බලපත්‍රය නිකුත් කිරීම නිර්දේශ කරමි. / ඉහත අඩුපාඩු නිවැරදි කරන ලෙස නිවැරදි කරන ලෙස දැනුම් දීම නිර්දේශ කරමි.*

. . . . . . . . . . . . . . . . . . . . . . . . .

දිනය: 20 . . . . . . . . . . . . . . . . .    මහජන සෞඛ්‍ය පරීක්ෂක / තාක්ෂණ නිලධාරි

---

මහජන සෞඛ්‍ය පරීක්ෂක / තාක්ෂණ නිලධාරි,

ඉහත අඩුපාඩු නිවැරදි කර ඇති බව දන්වා ඇත. පරීක්ෂා කර වාර්තා කරන්න.

. . . . . . . . . . . . . . . . . . . . . . . . .

නාගරික කොමසාරිස් / සභාපති

---

නාගරික කොමසාරිස් / සභාපති,

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල නියමවලට අනුව බලපත්‍රය නිකුත් කිරීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇත. බලපත්‍රය නිකුත් කිරීම සඳහා නිර්දේශ කරමි.

. . . . . . . . . . . . . . . . . . . . . . . . .

දිනය: 20 . . . . . . . . . . . . . . . . .    සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි / තාක්ෂණ නිලධාරි

(නිල මුද්‍රාව තබන්න)

නාගරික කොමසාරිස් / සභාපති,

1. ඉහත ඉල්ලුම් පත්‍රයෙහි 7 (ආ), 7 (ඇ) සහ 8 හි තොරතුරු සභාවේ ලේඛන සමග සැසඳේ. / නිවැරදි කර ඇත.
2. කර්මාන්තය/වෙළෙඳාම පවත්වා ගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම: රු: . . . . . . . . . . . . .කි.
3. පහත සඳහන් පරිදි මුදල් අය වීමට ඇත:

| | | |
|---|---|---|
| * | හිඟ වරිපනම් / අක්කර බදු (වරෙන්තු ගාස්තු සමග) | රු. . . . . . . . . . . . . . . . . . . . . . |
| * | හිඟ ජල සැපයුම් ගාස්තු (ප්‍රමාද ගාස්තු ඇත්නම්, ඒ සමග) | රු. . .. . . . . . . . . . . . . . . . . . . |
| * | අපද්‍රව්‍ය බැහැර කිරීමේ හිඟ ගාස්තු (හිඟ) | රු. . . . . . . . . . . . . . . . . . . . . . |
| * | බලපත්‍ර ගාස්තුව | රු. . . . . . . . . . . . . . . . . . . . . . |
| * | රජය විසින් කලින් කල නියම කරනු ලබන බදු හා ගාස්තු | රු. . . . . . . . . . . . . . . . . . . . . . |
| | එකතුව | රු. . . . . . . . . . . . . . . . . . . . . . |

. . . . . . . . . . . . . . . . . . . . . . . .

දිනය: 20 . . . . . . . . . . . . . . . . . විෂය භාර නිලධාරි

---

විෂය භාර නිලධාරි,

බලපත්‍රය සකස් කර ඉදිරිපත් කරන්න.

. . . . . . . . . . . . . . . . . . . . . . . .

දිනය: 20 . . . . . . . . . . . . . . . . . නාගරික කොමසාරිස් / සභාපති

---

නාගරික කොමසාරිස් / සභාපති,

(අ) පිළියෙල කළ බලපත්‍රයේ අංකය: . . . . . . . . . . . . . . . . . . . . . . . .

(ආ) බලපත්‍ර ගාස්තු ලේඛනයේ සටහන් කළ අනු පිළිවෙළ අංකය: . . . . . . . . . . . . . . . . .

(ඇ) බලපත්‍ර ලබාගත යුතු ආයතන ලේඛනයේ අනු අංක . . . . . . . . . යටතේ බලපත්‍රයට අදාළ තොරතුරු සටහන් කළා.

ඉහත නියෝගය අනුව සකස් කළ බලපත්‍රය අත්සනට ඉදිරිපත් කරමි.

. . . . . . . . . . . . . . . . . . . . . . . .

දිනය: 20 . . . . . . . . . . . . . . . . . විෂය භාර නිලධාරි

---

විෂය භාර නිලධාරි,

බලපත්‍රය අත්සන් කළා. හිඟ වරිපනම් හා වෙනත් අය වීම් ඇත්නම්, ඒවා සහ බලපත්‍ර ගාස්තු අය කර ගෙන, බලපත්‍රය නිකුත් කරන්න.

. . . . . . . . . . . . . . . . . . . . . . . .

දිනය: 20 . . . . . . . . . . . . . . . . . නාගරික කොමසාරිස් / සභාපති

(නිල මුද්‍රාව තබන්න)

ඇමුණුම් අංක 02

බලපත්‍රයේ අංකය:

සභාවේ
ලාංඡනය

# . . . . . . . . . . . සභාව

# වෙළෙඳ බලපත්‍රය . . . . 20 - වර්ෂය

. . . . . . . . . . . . . සභා බල ප්‍රදේශයට අදාළ ව සාදනු ලැබ ඇති, . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . පිළිබඳ අතුරු ව්‍යවස්ථා යටතේ මෙහි පහත අංක 1 හි සඳහන් නාමය සහ ස්වභාවයේ කර්මාන්තය/වෙළෙඳාම පවත්වා ගෙන යාම සඳහා අංක 2 යටතේ සඳහන් ස්ථානය පාවිච්චි කිරීම පිණිස අංක 3 හි විස්තර සඳහන් තැනැත්තා වෙත මෙම බලපත්‍රය නිකුත් කරන ලදී.

1. (අ) කර්මාන්තයේ/වෙළෙඳාමේ නාමය: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

   (ආ) කර්මාන්තයේ/වෙළෙඳාමේ ස්වභාවය: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. කර්මාන්තය/වෙළෙඳාම පවත්වනු ලබන ස්ථානයේ -

   (අ) ලිපිනය: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

   (ආ) වරිපනම් අංකය: . . . . . . . . . . . . . . . . .

3. (අ) කර්මාන්තය/වෙළෙඳාම හිමිකරු ගේ නම: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

   (ආ) ජාතික හැඳුනුම් පත්‍ර අංකය: . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

මේ බලපත්‍රය, ඉහත කී අතුරු ව්‍යවස්ථා යටතේ කලින් අවලංගු කරනු ලබන්නේ නම් එසේ අවලංගු කරනු ලබන දිනය හෝ ඉහත කී කර්මාන්තය හෝ කාර්යය 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ සාදන ලද නියෝග යටතේ පාලනය වන කර්මාන්තයක් හෝ කාර්යයක් වන විට ඒ සඳහා ලබාගත් පරිසර ආරක්ෂණ බලපත්‍රයේ වලංගු කාලය ඉකුත් වන දිනය හෝ 20 . . . . . වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දින හෝ යන දිනවලින් කලින් එළඹෙන දිනයේ දී අවසන් විය යුතු ය. තවද මේ බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ ඉහත කී කර්මාන්තය/වෙළෙඳාම පවත්වා ගෙන යාමට ඉහත නිශ්චිතව සඳහන් කරන ලද ස්ථානය පාවිච්චි කිරීමට පමණකි. මෙම බලපත්‍රය නිකුත් කිරීම හේතුවෙන්, එම බලපත්‍රය ලැබූ තැනැත්තාට ඒ කර්මාන්තය කරගෙන යනු ලබන ස්ථානය සඳහා නීත්‍යානුකූල හිමිකමක් ඇති බවට තහවුරු කිරීමක් හෝ එවැනි අයිතිවාසිකමක් තහවුරු කිරීමට සාක්ෂියක් නො විය යුතු ය.

මේ බලපත්‍රය මහජනතාවට පැහැදිලිව ප්‍රදර්ශනය වන සේ ඉහත කී ස්ථානයේ ප්‍රදර්ශනය කළ යුතු ය.

ගෙවන ලද ගාස්තුව: රු: . . . . . . . . . . . ලදුපත් අංකය: . . . . . . . . . . . දිනය: 20 . . . . .. . . . . . . . . .

QR Code

. . . . . . . . . . . . . . . . . . . . . . . . .
නාගරික කොමසාරිස් / සභාපති
. . . . . . . . . . . . . සභාව
(නිල මුද්‍රාව)

දිනය: 20 . . . . . .  . . . . . . . . . . .